# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## කොන්ත්‍රාත් පදනම මත විනයාරක්ෂක නිලධාරී (පිරිමි)

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින විනයාරක්ෂක නිලධාරී (පිරිමි) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

1. I. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධරයෙකු වීම.

   II. වයස අවුරුදු 30 – 55 අතර වීම.

   III. ශාරීරික යෝග්‍යතාව : උස අඩි 5 අඟල් 5 ට නොඅඩු විය යුතුය. පපුව අඟල් 32 (සාමාන්‍ය).

**සටහන :** පොලිස් හෝ හමුදා සේවයේ පළපුරුද්ද ලබා ඇති සහ ක්‍රීඩා කටයුතු, සමාජ සුභ සාධන ක්‍රියාකාරකම් සම්බන්ධව විශ්වවිද්‍යාල හා ජාතික මට්ටමේ ක්‍රියාකාරී සහභාගිත්වයක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

2. ශ්‍රී ලංකා හමුදා සේවයන්හි මේජර් නිලයක/ ශ්‍රී ලංකා පොලිස් සේවයේ එයට සමාන නිලයක හෝ ඊට නොඅඩු නිලයක පළපුරුද්දක් ඇති අයෙකු වීම.

**වැටුප :** රු. 70,000.00 (සියලු දීමනා ඇතුළත්)

**ප්‍රතිලාභ :** තෝරා ගන්නා අය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 8% ක ප්‍රමාණයක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් 12% කට සමාන ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවනු ඇත. ඊට අමතරව ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 3% කට සමාන ප්‍රමාණයක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවනු ඇත.

**අයදුම් කළ යුතු ආකාරය :**

තමන් විසින් සකස් කරන ලද සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් අයදුම්පතක් සහතිකවල පිටපත්ද සමඟ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයට 2024.08.07 දිනට පෙර ලැබෙන සේ තැපැල් මගින් එවීමට හෝ පැමිණ භාරදීමට හැකිය. සහතිකවල පිටපත් සමඟ 2024.08.07 දිනට පෙර විශ්වවිද්‍යාලය වෙත ලැබෙන අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට සලකා බලනු ලැබේ.

**සැලකිය යුතුයි :**

- පුරප්පාඩු පවතින්නේ මෙම විශ්වවිද්‍යාලයේ නාවල පරිශ්‍රයේ පමණි.
- 2023.03.27 දින පළ කරන ලද දැන්වීමට අනුව මෙම තනතුර සඳහා අයදුම් කළ අය නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ
2024.07.25